# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 64— 1973 ජූනි 14 වැනි බ්‍රහස්පතින්ද — 1973.06.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 731 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 739 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම ... ... | 734 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 735 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම... ... | 739 | විවිධ දැන්වීම් ... ... ... | — |



සැලකිය යුතුයි.—ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ජූනි 08 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

නාගදීප නිර්මාණ කොට්ඨාශයේ මාපකඩ–තිස්සපුර පාරේ (හැ. 4 දම. 19 දිග) පහත දක්වා ඇති වැඩ සඳහා ටෙන්ඩර් 1973.07.10 දින පෙරවරු 11 වන තෙක් මාපකඩ, නාගදීප නිර්මාණ ඉංජිනේරු විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදුවේ.

2. පහත සඳහන් ඒ ඒ වැඩ අනුව සඳහන් කර ඇති ගණන් වලට වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට, ගොවිකාරක සභා වලට සහ කම්කරු සමිතිවලට මෙම වැඩ සඳහා අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1973.06.18 දින සිට 1973.07.07 දින දක්වා (දෙදිනම ඇතුළුව) නාගදීප නිර්මාණ ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම් පත් සකස්කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතු ද නැද්ද යන්න සලකා බැලීම සඳහා නිර්මාණ ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර එකී වැඩ සඳහා පහත සඳහන් කර ඇති පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් නාගදීප නිර්මාණ ඉංජිනේරු තැනගේ කාර්‍යාලයේදී තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

4. මෙම වැඩ ගැන සියළුම විස්තර සහ සැළසුම් ආදිය කාර්‍යාලීය වේලාවන් තුලදී නාගදීප නිර්මාණ ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙන් බලා ගත හැකිය.

5. ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් අයදුම් කරුවන්ට පැමිණ සිටිය හැක.

| | වැඩවල නම | කොන්ත්‍රාත් කරුවන් ලියා පදිංචි විය යුතු අඩුම ගණන | | ටෙන්ඩර් තැන්පත් මුදල | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| 1. | අඟල් $1\frac{1}{2}$ සිට 2 දක්වා වූ කැටගල් (මෙටල්) සහ අඟල් $\frac{1}{4}$ සිට $\frac{1}{2}$ දක්වාවූ කුඩා කැටගල් (මෙටල් චිප්ස්) සපයා මිණිය හැකි සේ ගොඩ ගැසීම ... | 80,000 | 0... | 100 | 0 |
| 2. | කැටගල් සහ කුඩා කැටගල් අතුරා වතුර ඉස රෝලයෙන් තද කිරීම සහ 1 වැනි ස්ථරය හා 2 වැනි ස්ථරය තාර දැමීම ... | 60,000 | 0... | 100 | 0 |

කේ. ඩී. පී. පෙරේරා,
නිර්මාණ ඉංජිනේරු, නාගදීප ව්‍යාපාරය.

වාරිමාර්ග, නිර්මාණ ඉංජිනේරු කාර්‍යාලය,
නාගදීප ව්‍යාපාරය, මාපකඩ,
1973 ජූනි මස 1 වැනි දින.

6–543—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයන්හි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

731—B70919—15,665 (73/6)
B 1 ආ

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව—අම්පාර කච්චේරිය**

අම්පාර දිස්ත්‍රික්කයේ මෙහි පහත සදහන් වැඩ සඳහා 1973 ජූලි .06 වෙනි දින පෙරවරු 10 දක්වා අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ :—

| වැඩයේ නම | | ලියාපදිංචි විය යුතු මුදල රු. ශ. |
| --- | --- | --- |
| (1) පෙරියනීලාවනේ කොට්ඨාශ අංක 2 කුලච්චෙයි පාර | ... | 10,000 00 |
| (2) කල්ආර් පෙරියනීලාවනේ මාසිම් පාර | ... | 10,000 00 |
| (3) අලිවක්කලියාර් පාර | ... | 10,000 00 |
| (4) ලාහුගල පොදු ළිඳ | ... | 5,000 00 |
| (5) මාවඩිප්පල්ලෙයි පොදු ළිඳ | ... | 5,000 00 |
| (6) මධ්‍යම කඳවුරේ ජනපද නිලධාරි නිවස අළුත්වැඩියා කිරීම | ... | 5,000 00 |
| (7) 22ඒ ජනපද නිවාස අළුත් වැඩියා කිරීම | ... | 5,000 00 |

2. ඉහත සඳහන් කර ඇති වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට කොන්ත්‍රාත්කරුවන් වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට හා ලියාපදිංචි වී ඇති සමිති සංගම්වලට 73 ජූලි මස 04 වෙනි දින පස්වරු 2 දක්වා අම්පාර දිසාපති විසින් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ලියාපදිංචිය හා අනිකුත් අදාල දෑ සනාථ කිරීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයින් විසින් අම්පාර දිසාපති කාර්යාලයේ එකී එක් එක් වැඩය වෙනුවෙන් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 25 බැගින් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය. චෙක්පත් මුදල් ඇනවුම් හා තැපැල් ඇනවුම් ආදිය භාර ගනු නොලැබේ. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් නිදහස් කරනු ලැබේ. එහෙත් ඉහත දැක්වෙන මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් එම සමිතිවලට ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණ කොට පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍රය බහා එවන කවරයේ මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ ඉහල වම් කෙලවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම තැපෑලෙන් නො එවන්නේ නම්, අම්පාර දිසාපති කාර්යාලයේ ඉඩම් ශාඛාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි.

5. 1973 ජූලි මස 06 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් ෆෝර්ම විවෘත කරනු ලැබේ. එදින ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් පැමිණ සිටිය හැකියි.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගනු ලැබූ බවට ලිපියකින් දැන්වූ පසු, දින 14ක් ඇතුලත ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හා නියමිත ඇපය තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ඇප මුදල ජයග්‍රාහක ටෙන්ඩර් මුදලින් සියයට පහක් වේ.

7. ජයග්‍රාහී ටෙන්ඩර්කරුට භාරදෙන ලද කොන්ත්‍රාත්තුවේ වැඩ කරගෙන යන අතර, කොටස් මුදල් ලබා ගැනීමට අවශ්‍ය වුවහොත් එවැනි අවස්ථාවලදී කරන ලද වැඩ වලට තක්සේරු කරන වැඩ වල වටිනාකමෙන් සියයට අනූවකට සරිලන ප්‍රමාණයේ කොටස් මුදලක් ලබා ගත හැකිය.

8. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනස් විස්තර ඇත්නම්, අම්පාර දිසාපති කාර්යාලයේ, ඉඩම් අංශයෙන් දැනගත හැකිය.

එස්. විජයසිංහම්,
අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973 ජූනි මස 04 වෙනි දින,
අම්පාර දිසාපති කාර්යාලයේ දී ය.

6–569—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

---

**ආහාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් දැන්වීම**

ප්‍රයෝජනයට ගත නොහැකි පහත සඳහන් මෝටර් රථ මිල දී ගෙන යෑම සඳහා ටෙන්ඩර් පත්‍ර 1973 ජූලි මස 05 වෙනි දින සවස 12.00 දක්වා කොළඹ, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයෙහි ආහාර කොමසාරිස් විසින් භාරගනු ලැබේ :—

| | | |
| --- | --- | --- |
| ලොරි | — | 35 |
| කාර් | — | 1 |
| වෑන් | — | 1 |

එක් රථයක් සඳහා රු. 250 බැගින් තැන්පත් කිරීමෙන් 1973 ජූලි මස 04 වෙනි දින දහවල් 12.00 දක්වා ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩරය පිළිබඳ කොන්දේසි සහ අවශ්‍ය විස්තර ආහාර කොමසාරිස් ගෙන් ලබා ගැනීමට පුළුවන.

වී. පී. සිල්වා,
ආහාර කොමසාරිස් වෙනුවට.

1973 මැයි මස 30 වැනි දින,
ආහාර දෙපාර්තමේන්තුව,
330, යූනියන් පෙදෙස,
කොළඹ 2.

6–472—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

---

**මධ්‍යම දිසාවේ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය**

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ මධ්‍යම දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 වර්ෂය සඳහා ප්‍රවාහන රථවාහන/යන්ත්‍ර හා කාර්මික යන්ත්‍රෝප කරණ කුලියට ගැනීමේ ගාස්තු ප්‍රමාණයන් නිගමනය කිරීම සඳහා ලාංකිකයන් හා ලාංකික වූ වෙළඳ සමාගම්වලින් ටෙන්ඩර් පත් මෙසේ භාර ගනු ලැබේ :—

(1) ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි සම්පූර්ණ දිසාව සඳහා ගාස්තු ප්‍රමාණයන් සඳහන් කිරීම,

(2) මිනිපේ, කුණ්ඩසාලේ, මහනුවර, කඩුගන්නාව, ගලගෙදර, මාතලේ, ලග්ගල, දඹුල්ල, රත්තොට, ගම්පොල, නෝර්වුඩ්, කොත්මලේ, නුවරඑළිය, වලපනේ හා හඟුරන්කෙත ආදි කොට්ඨාශයන් සඳහා වෙන් වෙන්ව මිල ගණන් සඳහන් කිරීම.

2. මේ සඳහා 1973.7.17 දින පෙ. ව. 10 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලබන අතර එදිනම ඒවා විවෘත කරනු ලැබේ.

3. මේ ටෙන්ඩරය පිළිබඳ කොන්දේසි ආදිය 1973. 7. 16 දින දක්වා කුණ්ඩසාලේ පිහිටි දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේදී බලා ගැනීමට අයදුම්කරුවන්ට හැකි වන අතර ටෙන්ඩර් පත් නිකුත් කිරීමේ අන්තිම දිනය 1973. 7. 16 දින වේ. ටෙන්ඩර් පතක් ලබා ගැනීමට කැමති අයදුම් කරුවන් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් සඳහා රු. 25 ක ගාස්තුවක් ගෙවිය යුතුය.

සී. වී. ඉ. රෝසා,
මධ්‍යම දිසා වැඩ අධ්‍යක්ෂ.

මධ්‍යම දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
කුණ්ඩසාලේ, 1973. 6. 1.

6–430—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන කාර්යාලය—තංගල්ල

**හ/වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රයෝජනය පිණිස මිලට ගන්නා** ලද, දැනට අතිරික්තව සිටින ගොනෙකු මිල දී ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1973 ජූලි 05 වැනි දින පෙරවරු 10 දක්වා, තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරි විසින් භාර ගනු ලැබේ.

මේ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම රු. 10 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු තංගල්ල අධ්‍යාපන කාර්යාලයෙන් ලබා ගත හැක. 1973 ජූනි 30 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

මෙම ගොනා විදුහල්පතිගේ අවසරය ඇතිව විද්‍යාල භූමියේදී පරීක්ෂා කළ හැක. වැඩි විස්තර තංගල්ල, අධ්‍යාපන කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එන්. එල්. සී. එෆ්. කරුණාරත්න,
ප්‍රධාන අධ්‍යාපන නිලධාරි.

1973 මැයි මස 31 වැනි දින,
තංගල්ලේ, අධ්‍යාපන කාර්යාලයේ දීය.

6–433—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා නාවික හමුදාව—කල්පිටිය
## ආහාර ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම

1973 ජූලි 01 වැනි දින සිට 1973 දෙසැම්බර් 31 වැනි දින දක්වා (මාස 6කට) කල්පිටියේ ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත එළවළු, පොල්, කිරිපට්ටි නිෂ්පාදන සහ මස් සැපයීම සඳහා කොළඹ තැ. පෙ. 593, කොඩිගහ වීදියේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් සැපයීම් සඳහා ටෙන්ඩර් ආකෘති පත් පහත සඳහන් පරිදි කොළඹ තැ. පෙ. 593, ශ්‍රී ලංකා නාවික මූලස්ථානයේ නාවික හමුදාධිපති විසින් නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන අන්තිම දිනය : 1973.06.26 දවල් 12.00 දක්වා

ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අන්තිම දිනය : 1973. 06. 27 පෙරවරු 10.30 දක්වා

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනය සහ වේලාව : 1973. 06. 27 පෙරවරු 11 ට.

3. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීම සඳහා අයදුම්කරුගේ මුදල් තත්ත්වය සහ මෙම සේවා කරගෙන යාමේ හැකියාව පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහිතව ලිඛිත අයදුමක් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට මත්තෙන් රු. 75.00 ක නැවත ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් නාවික හමුදා මූලස්ථානයට ගෙවිය යුතුයි. ප්‍රේෂණ පත් භාරගනු නොලැබේ. මුදල් එවන විට නාවික හමුදාධිපති නමින් එවිය යුතුයි.

5. අයදුම් කරුවන්ගේ සම්පූර්ණ නම සහ ලිපිනයද සැපයිය යුතුයි.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593,
කොළඹ,
1973. 06. 05.

6–539—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

---

## ජාතික කිරි මණ්ඩලය

ඇලුමිනියම් පටිකැබෙලි සහ ඇලුමිනියම් කෑන් සුන්බුන්

ඉහත සඳහන් දෑ මිලදී ගැනීම සඳහා 1973 ජූනි මස 29 වැනි දින පස්වරු 2 දක්වා සීල් තැබූ ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

කොළඹ 5, නාරාහේන්පිට, කිරි මණ්ඩලයේ කිරි සකස් කිරීමේ කර්මාන්ත ශාලවේ සැපයුම් සහකාර (ගබඩා) වෙතින් ලබාගත හැකි පෝර්ම පත්‍රවල දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ආපසු නොගෙවිය හැකි රු. 25 ක ටෙන්ඩර් ගාස්තුවක් සහ ආපසු ගෙවිය හැකි මුදලින් රුපියල් 250 ක ඇපයක් තබන අයට 1973 ජූනි මස 28 වැනි දින පස්වරු 3 දක්වා ටෙන්ඩර් පෝර්මපත්‍ර නිකුත් කරනු ලැබේ.

මෙම ඇලුමිනියම් පටි කැබෙලි සහ ඇලුමිනියම් කෑන් සුන් බුන් ආදිය සතියේ දිනයන්හි පෙ. ව. 9 යේ සිට ප. ව. 3 දක්වාද, සෙනසුරාදා දිනයන්හි පෙ. ව. 9 සිට දිවා 12 දක්වාද, කොළඹ 5, නාරාහේන්පිට කිරි මණ්ඩලයේ කිරි සකස් කිරීමේ කර්මාන්ත ශාලාවේ මධ්‍යම ගබඩාවේදී පරීක්ෂාකර බැලිය හැක.

මේ සම්බන්ධ වැඩිමනත් විස්තර කොළඹ 5, කිරි මණ්ඩලයේ කිරි සකස් කිරීමේ කර්මාන්තශාලාවේ සැපයුම් සහකාර (ගබඩා) වෙතින් ලබාගත හැකි වේ.

සභාපති,
කිරි මණ්ඩලය.

ජාතික කිරි මණ්ඩලීය මූලස්ථානය,
තැ. පෙ. 1155, කොළඹ 5,
1973 මැයි මස 30 වැනි දින.

6–488—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

සේද ඔගන්සයින් නූල් සැපයීම සඳහා, ඒවා නිපදවන්නන්ගෙන් හා ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973.07.31 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. වැඩි විස්තර සහ ටෙන්ඩර් පත් සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය : 3/1/—(2/17),
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 ජූනි මස 04 වැනි දින.

6–429—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

**අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොළඹ 10 (මරදාන) ව්‍රිපොලි වෙළඳහලේ ආහාරෝගයශාලා සැපයීම් අංශයට 1973.12.31 න් අවසන් කාලය සඳහා කුකුල් මස් සැපයීමට ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජූනි මස 22 වෙනි දින අ.භා. 2 දක්වා භාරගනු ලැබේ. ඉහත සඳහන් ලිපිනයෙහි පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 බැඳ ලබාගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1973.6.22 වෙනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කායර්‍යාලයෙන් දැන ගැනීමට පිළිවන.

එන්. වාමදේව,
අලවේ කිරීමේ කොමසාරිස් වෙනුවට.

1973.6.4 වැනි දින,
කොළඹ 1,
අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී ය.

6-490 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

පිප්ප සෑදීම සඳහා වානේ තහඩු සැපයීම

(අ) ගැලුම් 46 ප්‍රමාණයේ ලිහිසි තෙල් පිප්ප,
(ආ) ගැලුම් 36 ප්‍රමාණයේ තාර පිප්ප,
(ඇ) මිහි තුල හා මත තඩාග සෑදීමේ මෘදු වානේ තහඩු.

කොළඹ 3, ගාලු පාරේ, අංක 113, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් වානේ තහඩු ආනයනය කොට සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ.

රුපියල් 100 ක නැන්පතුවකින් අදාල ටෙන්ඩර් කොන්දේසි හා විස්තර 1973. 06. 25 වන දින තෙක් ගබඩා හා සැපයීම් කළමනාකරුගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ටෙන්ඩර් භාර ගැනීම 1973. 06. 28 දින පූ. භා. 10.00 ට අවසන් වේ.

ගබඩා හා සැපයීම් කළමනාකාර තැන.

113, ගාලු පාර,
කොළඹ 3.

6-575/1—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

වානේ කැබලි

1973 ජූනි මස 5 වෙනි දින පෙරවරු 10.00 තෙක් භාර ගැනීමට නියමිතව තිබූ ටෙන්ඩර් පත් 1973 ජූනි මස 20 වෙනි දින පෙරවරු 10.00 තෙක් දීර්ඝ කරන ලදී.

ආපසු ලබා ගත හැකි රු. 2,000 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් 1973 ජූනි 19 දින දක්වා ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ගබඩා හා සැපයීම් කළමනාකරුගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3

6-575/2 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

යොමුව: පිඇස්ඩී 2/17/69.

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**ඔටෝමැටික් හයිප්‍රෙෂර් ස්ටෙලසිසර්ස් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඔටෝමැටික් හයිප්‍රෙෂර් ස්ටෙරිලයිසර්ස් සැපයීම සඳහා පහත සඳහන් ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) විදේශීය රටවල නාමගිය නිපදවන්නෝ,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ 10, 385, ඩීන්ස්පාර අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.7.31 දින පෙරවරු 10 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ:

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම් වලින්,

(ii) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරිමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛන හා වෙනත් විස්තර ඉතාලීය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකාව එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, ඩෙන්මාර්ක්, ස්විස්ටර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබා ගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

**SCHEDULE REFERRED TO**

7 Nos. only—Automatic High-Pressre Sterilizers

කොළඹ, 1973 මැයි 21 දින.

6-536—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## තීරණය කල ටෙන්ඩර් පත් පිළිබද දැන්වීම්

**පොලිස් දෙපාර්තමේන්තුව**

**ටෙන්ඩර් තීරණ**

1973 මාර්තු මස 9 වැනි දින නිකුත් වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද උරනිලා ලකුණු ජෝඩු 4,000 ක් සැපයීම පිළිබඳ ටෙන්ඩර් අවලංගු කර ඇති බව මෙයින් දන්වනු ලැබේ.

ජී. පුංචි මහත්මයා,
පොලිස්පති වෙනුවට.

1973 මැයි මස 26 වැනි දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේ දී ය.

6-478—73.06.14 දින අංක 64 දරනා ගැසට පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## දැන්වීමයි

කෑගල්ල මහේස්ත්‍රාත් උසාවිය—ප්‍රසිද්ධ වෙන්දේසිය

කෑගල්ල මහේස්ත්‍රාත් උසාවියේ රාජසන්තක කරන ලද හා අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පහත සඳහන් භාණ්ඩ 1973 ජූනි මස 30 වැනි දින පෙ.ව. 9 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් දැනුම් දෙනු ලැබේ.

බඩු මිළ දී ගනු ලබන්නන් විසින් එවේලේම මුදල් ගෙවා භාණ්ඩ ඉවත්කර ගත යුතුයි.

ඩබලිව්. ඇන්. ඩී. එම්. විල්ප්‍රඩ,
ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්.

1973 මැයි මස 31 වැනි දින,
කෑගල්ල මහේස්ත්‍රාත් උසාවියේ දීය.

### වෙන්දේසිය සඳහා තෝරා ඇති බඩු ලැයිස්තුව

| අංකය | | භාණ්ඩ විස්තර | මුදල |
|---|---|---|---|
| බී/1105/71 | ... | පොරවක් | |
| බී/52/72 | ... | මන්නයක් | |
| බී/520/72 | ... | පිත්තල මේස ලාම්පුවක් | |
| බී/303/72 | ... | පවුඩර් ටින් එකයි (1), ස්ත්‍රී අත් බෑග් 1 | |
| 88631 | ... | චිමිනියක්, ලක්ස්ප්‍රේ ටින් එකක් | |
| 79441 | ... | පින්තූර සමඟ කැඩුණු පින්තූරු රාමු | |
| 88398 | ... | මේස පිහියක් | |
| 78038 | ... | ගෑස් ලිපක ටැන්කියක් (පිත්තල) | |
| 85635/87020 | ... | සූට් කේස් 1 | |
| | | සාරි 1 | |
| | | පටි 2 | |
| | | ඇල්මිනියම් මුට්ටි 3 | |
| | | සාරි 4 | |
| | | රබර් සෙරෙප්පු කුට්ටම් 5 | |
| | | වූල් කැරලි 1 | |
| | | පැනල් රෙදි කැලි 1 | |
| | | පොප්ලින් රෙදි කැලි 1 | |
| | | තුවා 1 | |
| | | සබන් පෙට්ටි 1 | |
| | | පවුඩර් පෙට්ටි 1 | |
| | | සාස් පාන් 3 | |
| | | කුඩා බේසන් 1 | |
| | | බෙලෙක් කෝප්ප 1 | |
| | | බාස්කට්, පියන් 1 | |
| | | ප්ලාස්ටික් වතුර බෝතල් 1 | |
| 74221 | ... | පිහියා 1 | |
| 88629 | ... | වීදුරු මල් පෝච්චි 1 | |
| 79145 | ... | මන්නයක් | |
| 8073 | ... | පිහියක් | |
| බී/40/71 | ... | කැත්තක් | |
| 86082 | ... | කැත්තක් | |
| 75397 | ... | කුඩා තඹ හැලියක් | |
| 87940 | ... | පොල් කෙක්කක් | |
| 86072 | ... | කැඩුණු මර්පි රේඩියෝවක් | |
| 87495 | ... | මේස පිහියක් | |
| 85955 | ... | ලොකු බාල්දි 2 | |
| | | කාච්චි 1 | |
| 90797 | ... | පිහියක් | |
| 90803 | ... | යකඩ උකුනු ගහක් | |
| 84470 | ... | කැඩුණු කුඩයක් | |
| 88367 | ... | ඇසිඩ් හිස් බෝතලයක් (ලොකු) | |
| 10900 | ... | ඇල්මිනියම් මුට්ටි 1 | |
| | | හිස් හෝර්ලික්ස් බෝතල් 2 | |
| | | බෙලෙක් පිඟන් 7 | |
| | | මිරිස් ගලක උඩ ගල | |
| බී/92/72 | ... | කැත්තක් | |
| 72915 | ... | වප් පිහියක් | |
| 88187 | ... | මන්නයක් | |
| 93906 | ... | කැත්තක් | |
| 85547 | ... | කැත්තක් | |
| බී/22/71 | ... | පිහියක් | |
| 85657 | ... | ළමයි නාවන බේසන් | |
| | | කුඩා සෙම්බු 1 | |
| | | අඩි කෝදු 6 | |
| | | පවුඩර් ටින් 1 | |
| | | මහන නූල් පන්දු 105 | |
| | | සාස් පාන් 1 | |
| | | කුඩා බේසන් 2 | |
| 89108 | ... | යකඩ උකුනු දත්තක් | |
| 60887 | ... | බෙලෙක් කෝප්ප 2 | |
| 72964 | ... | වප් පිහියා 1 | |
| 87379 | ... | කැඩුණු පැට්‍රෝල් ලාම්පුවක් | |
| 74896 | ... | බෙලෙක් පිඟන් 1 | |
| | | තැටින් 4 | |
| 77964 | ... | හැලුමේ ටින් 2 | |
| 89799 | ... | කුඩා බෙලෙක් බැරල් 3 | |
| 84636 | ... | කැඩුණු ලාම්පු තෙල් ලිපක් | |
| 89639 | ... | පරණ බාල්දියක් | |
| | | සරමක් | |
| | | ටෝච් ඔලුවක් | |
| 91067 | ... | කැඩුණු ටෝච් 2 | |
| 90375 | ... | කැත්තක් | |
| බී/1331/71 | ... | නාස් ලනු කැලි 7 | |
| 93681 | ... | අත් දිග කමිස 1 | |
| | | කුඩා සපත්තු ජෝඩු 1 | |
| 85673 | ... | හිස් සීනි බෝතල් 1 | |
| 87442 | ... | කැත්තක් | |
| 87593 | ... | කුඩා කැත්තක් | |
| 85685 | ... | පිහියක් | |
| ඒ/736/65 | ... | පිලිප් කැඩුණු රේඩියෝවක් | |
| බී/76/71 | ... | පිහියක් | |
| 95062 | ... | තඹ සුර දෙකක් | |
| බී/936/71 | ... | පැට්‍රෝල් ලාම්පුවක උඩ පියනක් | |
| 94850 | ... | බාල්දියක් | |
| | | ගෑස් ලිපක ටැන්කියක් | |
| බී/1060/71 | ... | කැති දෙකක් | |
| 80157 | ... | ට්‍රන්ක් පෙට්ටියක් | |
| 91726 | ... | සූට් කේස් එකක් | |
| 91816 | ... | ඇඳුම් එල්ලනයන් 9 | |
| | | පිඟන් 8 | |
| | | තැටින් 2 | |
| | | මල් දීසි 1 | |
| | | පීරිසි 4 | |
| | | කෝප්ප 3 | |
| | | වීදුරු ජෝගු 1 | |
| | | ඩිම්පල් හිස් බෝතල් 1 | |
| | | මේස පිහියා 3 (තුනයි) | |
| | | අයිස් ක්‍රීම් කෝප්ප 6 | |
| | | බටර් දීසි 3 | |
| | | කිරි ජෝගු 1 | |
| | | එලාස්ටික් කෝප්ප 1 | |
| | | විදුලි බලෙන් වැඩ කරන වතුර උණු කරන උපකරණයක් | |
| | | සපත්තු මදින බුරුසු 1 | |
| | | ප්ලාස්ටික් කවර 2 | |
| | | පිඟන් 8 | |
| | | තැටින් 8 | |
| | | පීරිසි 6 | |
| | | කෝප්ප 8 | |
| | | අත් සෝදන කෝප්ප 4 | |
| | | දෙඩන් මිරිකන භාජනයක්—ප්ලාස්ටික් | |
| | | ඇඳ ඇතිරිලි 1 | |
| 91056 | ... | ඔට්ටුපාල සහිත බාල්දියක් | |
| 70752 | ... | පීරිසි 7 | |
| | | තේ හැඳි 7 | |
| | | ලොකු කෝප්ප 5 | |
| | | ටයිම් පීස් ඔර්ලෝසු 1 | |
| | | පිඟන් 1 | |
| | | කෝප්ප 2 | |
| | | පිත්තල විශාල දොර යතුරක් | |
| | | දීසි 2 | |
| බී/1027/71 | ... | ලාම්පුවක යට වීදුරු කොටස | |
| ඒ/1163/69 | ... | ස්ත්‍රී අත් බෑග් 1 | |
| | | යතුරු දමන වැග් 1 | |

| අංකය | | භාණ්ඩ විස්තර | මුදල |
|---|---|---|---|
| 52762 | ... | ස්ත්‍රී අත් බෑග් 1 | |
| | | අංක/81725/එප්සී දරණ කැඩුණු බාග බයිසිකල් 1 | |
| | | ඇලුමිනියම් මුට්ටි 3 | |
| | | කල් කොළ පෙට්ටි 2 | |
| | | අංක 018 ඒ 865 දරණ විලිස් වර්ගයේ එන්ජිමක් | |
| | | කැඩුණු පැට්‍රමැක්ස් ලාම්පු 1 | |
| | | පොල් කඩන පිහි 1 | |
| | | මන්නයක් | |
| | | පරණ රෙදි සහිත ට්‍රන්ක් පෙට්ටියක් | |
| | | ඉන්ජින් බොලොක් 1 | |
| | | වප් පිහියක් | |
| | | පරණ රෙදි සහිත කුඩා සූට් කේස් 1 | |
| | | වප් පිහියා 1 | |
| | | ළමයි නාවන බේසමක් | |
| | | පොරවක් | |
| | | කුඩා බේසන් 2 | |
| | | දැකැත්තක් | |
| | | පවුඩර් කේස් 1 | |
| | | ප්ලාස්ටික් පිඟන් 9 | |
| | | ට්‍රෙ 1 | |
| | | පිහියා 3 | |
| | | කැඩුණු ට්‍රෙ 1 | |
| | | බෙලෙක් කෝප්ප 2 | |
| | | කාර් රෝද කප් 3 | |
| | | හිස් ටොපි ටින් 3 | |
| | | හිස් බිස්කට් ටින් 5 | |
| | | වප් පිහි 2 | |
| | | ඇලුමිනියම් පිඟන් 5 | |
| | | කාර් පැට්‍රල් ටැන්කි 1 | |
| | | කැම්වලට දමන සායම් ටින් 2 | |
| | | වතුර අදින පූලියක් | |
| | | පිත්තල සෙම්බුවක් | |
| | | බෙලෙක් කෝප්ප 2 | |
| | | නැමුනු පයිප්පයක් | |
| | | ලන්තෑරුමක් | |
| | | ලොකු බාල්දි 1 | |
| | | මන්නා තලයක් | |
| | | පිඟන් මැටි බූලියක් | |
| | | කෙටි අලවන්ගු 5 | |
| | | වම් පිහි 1 | |
| | | ගල් කටු 6 | |
| | | පොඩි උදලු තල 2 | |
| | | ලොරියක කැඩුණු සයිඩ් කන්නාඩි 1 | |
| 85351 | ... | අංක ඒ 1 ඩී 18012 දරණ සයිකල් 1 | |
| | | කැඩුණු ගෑස් ලිපක ටැන්කියක්—පිත්තල | |
| | | කුඩා ටින් 3 | |
| | | කැඩුණු පැට්‍රෝල් ලාම්පු 2 | |
| | | ලොරි රිම් 1 | |
| | | අංක ඔජ් 2423 දරණ බයිසිකලය | |
| | | වෑ තල 1 | |
| | | ලාම්පු යට කැලි 2 | |
| | | කැති 3 | |
| | | පිහියක් | |
| | | කුඩා කතුරක් | |
| | | ස්ත්‍රී අත් බෑගයක් | |
| | | කිරි දීසි 4 | |
| | | පිරිමි අත් බෑග් 1 | |
| | | යකඩ කපන අඬුවක් | |
| | | පෙනේරයක් | |
| | | දෑ කැති 2 | |
| | | බල්ප් ලාම්පු කුප්පි 12 | |
| | | කුඩා තාච්චියක් | |
| | | අත් කියතක් | |
| | | පොඩි පිහියක් | |
| | | දම්වැල් කෑලි 1 | |
| | | ලොකු බේසන් 1 | |
| | | පිහියක් | |
| | | කාර් සීල් බීම් 1 | |
| | | අංක ඕ-0495 සයිකලය | |
| | | සල්ටාර් වර්ගයේ ඔර්ලෝසු තරාදියක් | |
| | | වම් පිහියක් | |
| | | පිත්තල පඩික්කම් 2 | |
| | | ඉරන කියතක් | |

| අංකය | | භාණ්ඩ විස්තර | මුදල |
|---|---|---|---|
| | | ළමයි නාවන බේසන්—ලොකු 1, කුඩා 2 | |
| | | ගැලුම් 4 ටින් 44 | |
| | | කුඩා බැරල් 39 | |
| | | ගැලුම් 4 ප්ලාස්ටික් කෑන් 31 | |
| | | ගැලුමේ ප්ලාස්ටික් කෑන් 15 | |
| | | ඇලුමිනියම් මුට්ටි 36 | |
| | | පිඟන් මැටි බීලියක් | |
| | | සෝස් පාන් 4 | |
| | | ගැලුමේ ටින් 1 | |
| | | කුඩා බාල්දි 1 | |
| 48046 | ... | එම්/808 දරණ බයිසිකලය | |
| | | ගැලුම් 45 බැරල් 5 | |
| | | එම හාග 1 | |
| | | කුඩා ටින් 2 | |
| | | පිඟන් 6 | |
| | | බෙලෙක් පිඟන් 9 | |
| | | තේ ජෝගු 1 | |
| | | බෙලෙක් කෝප්ප 1 | |
| | | ලාම්පු ආවරණ 1 | |
| | | පොල් ගෝනි 2 | |
| | | රවුම් කායහිල ඔර්ලෝසු 1 | |
| | | කැඩුණු ප්ලාස්ටික් උණු වතුර බෝතල් 1 | |
| | | ගෑස් ලිපක ටැන්කියක් | |
| | | කැඩුණු බෙරයක් | |
| | | ඔටවුපාල කුට්ටියක් | |
| 79932 | ... | බයිසිකලයක් | |
| | | ගෑස් ලිපක ටැන්කියක් | |
| | | ප්ලාස්ටික් පිඟන් 1 | |
| | | වප් පිහි 2 | |
| | | බාල්දියක් | |
| | | පරණ රෙදි සහිත සූට් කේස් 1 | |
| | | ටෝච් 1 | |
| | | වප් පිහියක් | |
| | | වේවැල් කූඩයක් | |
| | | පිහියක් | |
| | | නිල් පාට සපත්තු 2 | |
| | | පිඟන් 1, පිරිසි 2 | |
| | | මධ්‍යම ප්‍රමාණයේ තඹ හැලියක් | |
| | | ඩීඑල් 1015 සයිකලයක් | |
| | | තේ හැඳි 1 | |
| | | අඩු කෝප්පයක් | |
| | | බෙලෙක් කෝප්පයක් | |
| | | ඇලුමිනියම් ජෝගුවක් | |
| | | ටයිම්පිස් ඔර්ලෝසු 3 | |
| 94542 | ... | ලන්ලෝ උදලු තලයක් | |
| 95444 | ... | කැත්තක් | |
| 96335 | ... | කමිසයක් | |
| 94558 | ... | බාල්දි 2 | |
| | | ඩී 047 සයිකල් 1 | |
| | | රබර් රොටි හොණ්ඩරයක් පමණ | |
| | | ඩීර් 2524 සයිකල් 1 | |
| 72956 | ... | ඔර්ලෝසුවක් (අතේ බඳින) කැඩුණ | |
| | | අත් ඔර්ලෝසුවක්—එනිකා (කැඩුණු) | |
| 24974 | ... | කැඩුණු ස්ත්‍රී අත් ඔර්ලෝසුවක් | |
| 29389 | ... | අත් ඔර්ලෝසුවක් | |
| 28224 | ... | කැඩුණු අත් ඔර්ලෝසුවක් | |
| 29890 | ... | අත් ඔර්ලෝසුවක් | |
| 76585 | ... | පයිලට් පෑනක් | |
| | | පාකර් බෝල්ට් පොයින්ට් පෑනක් | |
| 72956 | ... | පටිය රහිත කැඩුණු අත් ඔර්ලෝසුවක් | |
| 65118 | ... | අත් ඔර්ලෝසුවක් | |
| 59296 | ... | අත් ඔර්ලෝසුවක් | |
| 52353 | ... | අත් ඔර්ලෝසුවක් | |
| 52932 | ... | අත් ඔර්ලෝසුවක් | |
| 52822 | ... | අත් ඔර්ලෝසුවක් | |
| 50070 | ... | අත් ඔර්ලෝසුවක් සහ බෝල්පොයින්ට් පෑනක් | |
| 84114 | ... | අත් ඔර්ලෝසුවක් | |
| 81107 | ... | අත් ඔර්ලෝසුවක් | |
| 82069 | ... | අත් ඔර්ලෝසු 2ක් සහ පෑන් 1 | |
| 88771 | ... | අත් ඔර්ලෝසු 1 | |
| 88178 | ... | අත් ඔර්ලෝසු 1 | |

| අංකය | | භාණ්ඩ විස්තර |
|---|---|---|
| 87910 | ... | අත් ඔර්ලෝසු වක් |
| 85801/85802 | ... | අත් ඔර්ලෝසුවක් |
| 85863 | ... | අත් ඔර්ලෝසුවක් |
| 88967 | ... | අත් ඔර්ලෝසුවක් |
| 89145 | ... | අත් ඔර්ලෝසුවක් |
| ඒ 1126/69 | ... | අත් ඔර්ලෝසුවක් |
| ඒ 32/45 | ... | උල්පත් පෑනක් |
| ඒ 619/65 | ... | අත් ඔර්ලෝසුවක් |
| ඒ 3/54 | ... | ස්ත්‍රී අත් ඔර්ලෝසුවක් |
| 91290 | ... | සාක්කු පිහියක් |
| ඒ 499/70 | ... | අත් ඔර්ලෝසුවක් |
| ඩී 629/71 | ... | අත් ඔර්ලෝසුවක් |
| 83331 | ... | පවුන්ටන් පෑනක් |
| ඒ 462/65 | ... | අත් ඔර්ලෝසුවක් |
| 84206 | ... | මේස ඔර්ලෝසුවක් |

6–538—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයට අයෝග්‍ය හා අමතරව ඇති භාණ්ඩ විකිණීම**

කොළඹ කොඩිගහ වීදියේ ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ දී, 1973 ජූනි මස 22 වෙනි දින පෙරවරු 10.30 ට පහත දැක්වෙන විෂයයන් ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලැබේ.

වෝල්ට් 12 බැටරි, වෝන්ෆ් ස්ප්‍රින් ඇඳන්, උදුන් තුනේ ලිප්, පොල් ගාන මැෂින්, ඇලුමිනියම් පිඟන්, උදුන් දෙකේ ලිප්, පිසින බුරුසු, වැහිකබා, විදුලිපංදම්, බිම ඇතිරිලි, ගැලුම් 400/ ටැංකි, බැරෝමීටර්ස්, කැරම් බෝඩ්, ජෙරිකෑන්, ලයිෆ් ජැකට්, පිටපත් කිරීමේ යන්ත්‍රය, බුරු ඇඳන්, ඇලුමිනියම් භාජන, ඇලුමිනියම් කෝතල, බදින භාජන, ශීතකරණ, නැප්සෙක් ස්ප්‍රේයර්, විදුලි ස්ත්‍රික්කය, විදුලි බොයිලේරුව, විදුලි කේතල, ඇලුමිනියම් බොයිලේරුව, එලාම් ඔරලෝසුව, ඉඳි ආප්ප වංගෙඩි, විපින් කැරියර්, මස් අඹරන යන්ත්‍රය, අල පොඩි කරණ යන්ත්‍රය, සිටුවන ලාම්පු, අඩි 14 ඩිංගිය, පාවිච්චි කරණ ලද මෝටර් රථ අමතර කොටස් හා ටයර්

2. විකුණන දිනයේ පෙරවරු 8 සිට මෙම විෂයයන් පරීක්ෂා කළ හැක.

3. වෙන්දේසිය නිමාවත් ම සම්පූර්ණයෙන් ම මුදල් ගෙවිය යුතු අතර, එදින පස්වරු 3.30 ට පෙර මිලදී ගත් විෂයයන් ඉවත් කර ගත යුතු වේ.

ඩී. බී. ගුණසේකර,
නාවික හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා නාවික හමුදාව,
කොළඹ 1.
1973 ජූනි 1 දී ය.

6–471—73.06.14 දින අංක 64 දරසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

**ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

ත්‍රිකුණාමලය, ශ්‍රී ලංකා නාවික හමුදා තටාකාංගණයේ දි 1973 ජූනි මස 22 වැනි දින පෙරවරු 9 ට පහත දැක්වෙන සේවයට නොසුදුසු ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| තොග අංකය | | විස්තරය |
|---|---|---|
| (1) | ... | හිස් පීප්ප, ස්පැනර්, ඇලුමිනියම් පිඟන් යනාදිය. |
| (2) | ... | ඩිලැන්කට් සුදු. |
| (3) | ... | ඔයිල් කෑන්, ස්පැනර්, පීරි යනාදිය. |
| (4) | ... | ඩිලැන්කට් පාට යනාදිය. |
| (5) | ... | ට්‍රාන්ස් මීටර්, රිසීවර් යනාදිය. |
| (6) | ... | හිස් බෑග්, වතුර මීටර් සහ පොදු විෂයන්. |
| (7) | ... | කුෂන්, කුෂන් කවර, ඩිලැන්කට්ස් යනාදිය. |
| (8) | ... | හිස්තෙල් පීප්ප. |
| (9) | ... | ගිනි නිවන උපකරණ, ලන්තෑරුම් යනාදිය. |
| (10) | ... | ගෘහ භාණ්ඩ. |
| (11) | ... | හිස් තාර පීප්ප. |
| (12) | ... | මෙරට උළු, බෝවර් උදුන්. |
| (13) | ... | හයිඩ්‍රෝෆොයිල් යාත්‍රාව. |
| (14) | ... | වේග මෝටර් යාත්‍රාවක් 35′. |
| (15) | ... | ක්ලින්කර් බිල්ට් මෝටර් කටරය 26′. |
| (16) | ... | ෆයිබර් ග්ලාස් ඩින්ගි 9′ 6″—2 යි. |
| (17) | ... | ලී ඩින්ගි යාත්‍රා 14′ |
| (18) | ... | ප්ලයිවුඩ් යාත්‍රාවක් 15′×5′ 7″. |
| (19) | ... | ලී යාත්‍රා 26′×8′. |
| (20) | ... | ලිවේලර් යාත්‍රාවක් 27′. |

2. වෙන්දේසිය කරන දිනයේ පෙරවරු 8 සිට මෙම භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

3. වෙන්දේසිය නිමාවෙත් ම සම්පූර්ණයෙන් ම මුදල් ගෙවිය යුතු අතර, 1973 ජූනි 23 වැනි දින දහවල් 12 ට පෙර මිලදී ගත් භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

නාවික හමුදපති.

6-471/2—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

**දිස්ත්‍රික් උසාවිය—අනුරාධපුරය**

**රාජසන්තක කළ භාණ්ඩ**

අනුරාධපුර දිස්ත්‍රික් හා මහේස්ත්‍රාත් උසාවියේ පවරණ ලද නඩුවල රාජසන්තක කරන ලද පහත දක්වා ඇති භාණ්ඩ 1973 ජූනි මස 30 වෙනි දින ප. ව. 2 ට උසාවි ගොඩනැගිල්ලේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| නඩු අංකය | | භාණ්ඩ |
|---|---|---|
| 26411 | ... | බුරුත කොට 18 යි. |
| 26412 | ... | බුරුත කොට 19 යි. |
| 40787 | ... | බුරුත කොට 5 යි. |
| | | තේක්ක කොට 7 යි. |
| 41174 | ... | හුලංහික් ඉරූ ලෑලි 59 යි. |
| 44845 | ... | වල් ඇඹරැල්ල සහ දියලබු කොටන් 46 යි. |

තව දුරටත් දැනුම් දීමයි——

මෙම ද්‍රව්‍ය පරීක්ෂා කර බැලීමට යම් කෙනෙක් කැමති නම්, ලේකම් මහතාගේ අනුමැතිය ලබා මෙම විකිණීම ආරම්භ කිරීමට පැයකට පෙර පරීක්ෂාකර බැලිය යුතුය.

2. තමන් ඉල්ලූ මුදලට මෙම ද්‍රව්‍ය තීරණය වූ විට සම්පූර්ණ මුදලම ගෙවා, විකිණීම අවසන් වූ විට බඩු රැගෙන යා යුතුය. ප්‍රවාහනය සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම උසාවියෙන් කරනු නොලැබේ.

3. චෙක්පත් මගින් ගෙවීම් භාරගනු නොලැබේ.

ඩබ්ලිව්. පී. එන්. ද සිල්වා,
දිස්ත්‍රික් විනිශ්චයකාර තුමා හා
මහේස්ත්‍රාත්,
අනුරාධපුරය.

1973 අප්‍රේල් මස 23 වෙනි දින,
අනුරාධපුර දිස්ත්‍රික් උසාවියේදීය.

6-482 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

### කුලියාපිටිය මහේස්ත්‍රාත් උසාවියේ භාණ්ඩ වෙන්දේසිය

බඩුබාහිරාදිය විකිනීම

රාජසන්තක කරන ලද හා අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පහත සඳහන් භාණ්ඩ කල්වේලා ඇතිව අයිතිවාසිකම් ඉදිරිපත් කර එම භාණ්ඩ ලබා නොගතහොත්, එම භාණ්ඩ 1973 ජූනි මස 23 වැනි දින පෙරවරු 10 ට කුලියාපිටිය මහේස්ත්‍රාත් උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වමි.

එම භාණ්ඩ වෙන්දේසි කරනු ලබන දිනය පෙ.ව. 8 ට උසාවි භූමියේ දී පරීක්ෂා කළ හැකිය.

වෙන්දේසියේ සාර්ථක ඉල්ලුම් කරුවන් විසින් මිල දී ගන්නා ලද භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දීම නියම මුදල් ගෙවා, එම භාණ්ඩ වහාම උසාවි භූමියෙන් ඉවත් කළ යුතුය.

ඊ. පී. රත්වත්ත,
මහේස්ත්‍රාත්, කුලියාපිටිය,

1973 මැයි මස 31 දින,
කුලියාපිටිය මහේස්ත්‍රාත් උසාවියේ දීය.

#### පහත අංක සඳහන් නඩුවලට අයත් කැති, මන්න පිහි, උදළු ආදිය

| | | |
|---|---|---|
| බී. 24/70 | 53293 | බී. 305/69 |
| බී. 188/69 | බී. 511/68 | 52080 |
| 47339 | 56823 | 56683 |
| බී. 28/70 | 57810 | බී. 14/69 |
| 51822 | 56014 | බී. 566/70 |
| බී. 380/70 | 47225 | 54923 |
| 64503 | 51950 | — |

උදළු 7යි, කැති 13යි, මන්නාපිහි 2යි, බාල්දි 1යි, මෝල්ගස් 1 යි.

#### පහත අංක සඳහන් නඩුවලට අදල ප්ලාස්ටික් කෑන්

| | | | | |
|---|---|---|---|---|
| 64898 | 64897 | 65035 | 65048 | 65085 |
| 65090 | 64636 | 65116 | 65486 | 65490 |
| 65542 | 65544 | 65546 | 65680(3) | 65681 |
| 65715 | 65823 | 65811 | 65920 | 65797 |
| 65847 | 65925 | 66003 | 66137 | 66139 |
| 66326 | 66334 | 66564 | | |

#### පහත අංක සඳහන් නඩුවලට අයත් ඇළුමිණියම් මුට්ටි

| | | | | | |
|---|---|---|---|---|---|
| 65991 | 65550 | 65563 | 65290 | 65293 | 65223 |
| 65293 | 65292 | 65295 | 65289 | 65367 | 65250 |
| 65418 | | | | | |

#### පහත අංක සඳහන් නඩුවලට අයත් හිස් බෝතල

| | | | | | |
|---|---|---|---|---|---|
| 64901 | 64900 | 64899 | 64903 | 64902 | 64898 |
| 64897 | 64933 | 64932 | 64928 | 64927 | 64931 |
| 64932 | 64944 | 64943 | 64942 | 64941 | 64940 |
| 64930 | 64945 | 64967 | 64968 | 64973 | 64974 |
| 64972 | 64971 | 64970 | 64966 | 64960 | 64961 |
| 65034 | 65035 | 65036 | 65037 | 64816 | 64893 |
| 64999 | 65002 | 65003 | 65004 | 65007 | 65006 |
| ඒ. 785/72 | 65041 | 65048 | 65050 | 65049 | 65047 |
| 65072 | 65070 | 65085 | 65087 | 65088 | 65089 |
| 65090 | 65514 | 65185 | 65186 | 65796 | 65195 |
| 65194 | 65197 | 65227 | 65226 | 65225 | 65222 |
| 65221 | 65223 | 65239 | 65241 | 65240 | 65260 |
| 65263 | 65262 | 65224 | 65265 | 65264 | 65282 |
| 65278 | 65288 | 65291 | 65290 | 65295(4) | 65292 |
| 65289 | 65294 | 65313 | 65312 | 65319 | 65318 |
| 65314 | 65320 | 65321 | 65322 | 65261 | 65352 |
| 65347 | 65349 | 65350 | 65351 | 65348 | 65370 |

#### පහත අංක සඳහන් නඩුවලට අයත් හිස් බෝතල

| | | | | | |
|---|---|---|---|---|---|
| 65363 | 65449 | 65450 | 65356 | 65355 | 65249 |
| 65453 | 65460 | 65354 | 65462 | 65486 | 65487 |
| 65488 | 65489 | 65490 | 65564 | 65565 | 65618 |
| 65619 | 65621 | 65653 | 65652 | 65651 | 65650 |
| 65649 | 65647 | 65648 | 65678 | 65679 | 65715 |
| 65716 | 65717 | 65721 | 65719 | 65720 | 65992 |
| 65993 | 66025 | 66026 | 66014 | 66017 | 66015 |
| 66016 | 66013 | 66047 | 66048 | 66049 | 66050 |
| 66051 | 66041 | 66042 | 66043 | 66044 | 66045 |
| 67002 | 67001 | 67003 | 66127 | 66128 | 66129 |
| 66131 | 66136 | 66137 | 66141 | 66142 | 66143 |
| 66145 | 66144 | 66147 | 66171 | 66170 | 66166 |
| 66172 | 66168 | 65281 | 66204 | 66206 | |

#### පහත අංක සඳහන් නඩුවලට අදල භාණ්ඩ

ඒ. 333/73 ... අංක ඞී.ඞී./94895 සිට එකතැති රථලේ පාපැදිය.
ඒ. 89/72 ... බී.කේ. 48738 අංක දරණ රථලේ පාපැදිය.
ඒ. 50/72 ... ඞී.එච්. 2208 අංක දරණ හම්බර් පාපැදිය
ඒ. 19/72 ... පැට්‍රොල්මැක්ස් ලාම්පු එකයි.
ඒ. 690/69 ... කැපිටල් වර්ගයේ අත් ඔරලෝසු එකයි.
ඒ. 714/70 ... අංක ඞී.යූ. 1245 දරණ රථලේ වර්ගයේ පාපැදි එකයි.
58447 ... ඕ.එන්. 1364 අංක දරණ රථලේ පාපැදිය.
53118 ... ඒ.ආර්. 80310 අංක දරණ රථලේ පාපැදි එකයි.
56306 ... පී.ඇම්. 1538 අංක දරණ හම්බර් පාපැදි එකයි.
ඒ. 171/72 ... අංක ඒ.ටී. 29316 දරණ පාපැදි එකයි.
එම ... අංක ඞී.ටී. 215 දරණ පාපැදි එකයි.
එම ... අංක ඇම්. 6639 දරණ පාපැදි එකයි.
ඒ. 501/71 ... අංක සී.එක්ස්. 2168 දරණ පාපැදි එකයි.
ඒ. 164/69 ... අංක ඇම්. 51 දරණ පාපැදි එකයි.
64582 ... ගැසලේ වර්ගයට අයත් පාපැදි එකයි.
61257 ... අංක 22732 දරණ පාපැදි ෆ්‍රේම් එකයි.
57078 ... අංක DM 808 දරණ පාපැදි එකයි.
ඒ. 702/65 ... අංක CL 84456 දරණ පාපැදි එකයි.

#### නඩු අංක සඳහන් නැති භාණ්ඩ

බී.ආර්. 56223 දරණ පාපැදිය.
ඩී. 271318 දරණ පාපැදිය.
බී. 102713 දරණ පාපැදිය.
එක්ස්. 59360 දරණ පාපැදිය.
ඩී.සී. 73491 දරණ පාපැදිය.
බී.ඇල්. 7351 දරණ පාපැදිය.
මෝල් ගස් නවයයි.
කැති හතලිස් පහයි.
කැති හතලිස් පහයි.
උදළු හයයි.
හිරමන එකයි.
ලන්ස එකයි.
යවුල් එකයි.
දැති ගොයියන් තුනයි.
මන්නාකැති විස්සයි
යකඩ කූලි එකයි.
විදුලි පන්දම් නවයයි.

#### පහත අංක සඳහන් නඩුවලට අදල භාණ්ඩ

ඒ. 322/72 ... ' ෂෙල්ටන් ' වර්ගයේ තරාදි එකයි.
ඒ. 362/73 ... ෆ්ලොරසන්ට් විදුලි ලයිට් 4යි.
ඒ. 92/72 ... බිත්ති ඔරලෝසු එකයි.

6-445—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

දැව වෙන්දේසිය—බටහිර දිසාව

තොග 25 කින් යුත් ඉරුම් කියත් හයක් ද, බන්ඩි කියත් 8 ක් ද, පිහියා 3 ක් ද, වෑය 1 ක් ද, පොරව 10 ක් ද, කියත් අඩු 2 ක් ද, කැති 1 ක් ද, දුන් ඉරු දැව ඝන අඩි 2.4 ක් ද, ඝන අඩි 21.5 ක් වූ දෙල් ඔරු 1 කින් සමන්විත දැව සහ භාණ්ඩ තොගයක් බස්නාහිර දිසාවේ දිසා වන නිලධාරි විසින් 1973 ජූනි මස 20 වැනි දින පෙරවරු 10 ට මතුගම අඩවි වන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන හවතුන් වෙන්දේසියට පෙර එම දැව සහ භාණ්ඩ බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර රත්නපුර දිසා වන නිලධාරී ගෙන් හෝ මතුගම අඩවි වන නිලධාරිගෙන් ලබාගත හැක.

දිසා වන කාර්යාලය,
රත්නපුර.

එච්. ආර්. පීරිස්,
දිසා වන නිලධාරි, බටහිර දිසාව,

6-541 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

දැව වෙන්දේසිය—බස්නාහිර දිසාව

මිල්ල, ඇරිද්ද, දෙල්, දුන්, අළුබෝ, දාඹු, වැලිපියන්න, හැඩවක. ඇල්බීසියා, පෙලෙන්, දියපර, ඇටඹ, මළබොඩ, හොර කඳන් ඝන අඩි 235.6 ක් සහ ඉරූ දැව ඝන අඩි 225.0 ක් ද, මිල්ල කම්බි කණු 20 ක් ද, ලොකු පොරවක් ද, අත් පොරවක් ද, ගැරුම්වට්ටි 3 ක් ද, පිහියා 2 ක් ද, උදලු 4 ක් ද, කුඩා 6 ක් ද සහ ඉල්ලන්කුරු 4 කින් ද, සමන්විත තොග 13 කින් යුත් දැව සහ භාණ්ඩ තොගයක් රත්නපුර දිසා වන නිලධාරී විසින් 1973. 06. 21 දින පෙරවරු 10 ට රත්නපුර අඩවි වන නිලධාරී කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියට ප්‍රථම මෙම දැව බලා සෑහීමකට පත්වන ලෙස සියළුම ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර රත්නපුර දිසා වන නිලධාරී ගෙන් හෝ රත්නපුර අඩවි වන නිලධාරීගෙන් ලබාගත හැක.

එච්. ආර්. පීරිස්,
දිසා වන නිලධාරි, බටහිර දිසාව.

දිසා වන කාර්යාලය,
රත්නපුර.

6-542 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ නාගරික මහේස්ත්‍රාත් උසාවිය

ප්‍රසිද්ධ වෙන්දේසියක්

1973 ජූනි මස 28 වැනි දින සවස 3 ට කොළඹ නාගරික මහේස්ත්‍රාත් උසාවියේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙමි. වෙන්දේසියට තිබෙන භාණ්ඩ පිළිබඳ විස්තර 1973 ජූනි මස 21 වැනිදායින් පසු මෙම උසාවියෙන් දැන ගත හැක.

එම්. එච්. බී. මොරායස්,
කොළඹ, නාගරික මහේස්ත්‍රාත්.

1973 මැයි මස 28 වැනි දින,
කොළඹ, නාගරික මහේස්ත්‍රාත් උසාවියේ දීය.

6–456 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

### 1973/74 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම

පුත්තලම දිස්ත්‍රික්කය

1973 ජූලි මස 01 වැනි දින සිට 1974 ජූනි මස 30 වැනි දින දක්වා වූ කාලය තුල පහත දක්වෙන උපලේඛනයේ විස්තර සඳහන් පරිදි රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාද මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා 1973 ජුනි මස 18 වැනි දින පෙරවරු 10 දක්වා පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පුත්තලම කච්චේරියේ දී භාර ගනු ලැබේ. මෙම ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලබන්නේ 1973 මැයි මස 25 වෙනි දින අංක 61 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් 1973/74 වර්ෂයේ රා තැබෑරුම් විකිණීම සම්බන්ධව පළ කරවනු ලැබූ කොන්දේසිවලට යටත්වය.

බ. සු. විජේවීර,
පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජුනි මස 2 දින,
පුත්තලම දිසාපති කාර්යාලයේ දීය.

උපලේඛනය

| අංකය | | කොට්ඨාශය | | ග්‍රාමය |
|---|---|---|---|---|
| 3 | ... | පුත්තලම පත්තුව | ... | මදුරන්කුලිය |
| 4 | ... | එම | ... | මුක්කුතොඩුවාව |
| 8 | ... | හළාවත පළාත් ආණ්ඩු සභාව | ... | හළාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 3 දරණ කොට්ඨාශය —අළුත්වත්ත |
| 9 | ... | උතුරු පිටිගල් කෝරලේ | ... | දකුණු උඩප්පුව |
| 10 | ... | එම | ... | කරුකුපොනේ |
| 11 | ... | එම | ... | ආරච්චිකට්ටුව |
| 12 | ... | එම | ... | බත්තුළුඔය |
| 15 | ... | නාත්තන්ඩිය | ... | මූදුකටුව |
| 17 | ... | එම | ... | මට්ටාකොටුව |
| 19 | ... | වෙන්නප්පුව | ... | තඹරවිල |
| 20 | ... | එම | ... | නන්ජුන්ඩන්කරේ |
| 21 | ... | එම | ... | වයික්කාල |
| 22 | ... | එම | ... | බොරලැස්ස |
| 23 | ... | එම | ... | දුම්මලදෙනිය |
| 24 | ... | එම | ... | උල්හිටියාව |
| 25 | ... | එම | ... | කටුනේරිය |
| 26 | ... | එම | ... | ලුණුවිල |
| 28 | ... | එම | ... | නැගෙනහිර නයිනමඩම |

6–423—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නොවන දැන්වීම්

✓

### ලංකා හෝටල් සංස්ථාව

දැන්වීමයි

වර්ෂ 1973 ජූනි මස 13 වැනි දින සිට 1973 ජූනි මස 27 වැනි දින දක්වා (දෙදිනම ඇතුළුව) ලංකා හෝටල් සංස්ථාවේ කොටස් කරුවන්ගේ ලේඛනය හා කොටස් හුවමාරු ලේඛනය වසා තබනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලේකම්,
ලංකා හෝටල් සංස්ථාව.

කොළඹ දීය
1973 ජූනි මස 08 වැනි දින දීය.

6-586—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

✓

### ලංකා හෝටල් සංස්ථාව

දැන්වීමයි

වර්ෂ 1973 ජූනි මස 27 වැනි දින පස්වරු 2.00 ට කොළඹ 3, ගාලු මුවදොර මැද පාරේ පිහිටි "සමුද්‍ර හෝටලයේදී" ලංකා හෝටල් සංස්ථාවේ හත් වැනි සාමාන්‍ය සභා රැස්වීම පවත්වන බව මෙයින් දැනුම් දෙනු ලබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලේකම්,
ලංකා හෝටල් සංස්ථාව.

කොළඹ දීය
1973 ජූනි මස 15 වැනි දින දීය.

6-587 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙර කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි**

කළුතර උතුරේ විලේගොඩ විවේකාරාම පාරේ අංක 158 හි පදිංචි විල්බට් සිල්වා අසුරමුනි වන මම අද සිට පුරා මසක් ගතවූ පසු කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන මෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. එස්. අසුරමුනි.

1973 ජූනි මස 4 වන දින.

6-512 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

**දැන්වීමයි**

මෙහි පහත නම් සඳහන් ගාලු දිස්ත්‍රික්කයේ වලහන්දූවේ මානවිල පදිංචි ගාඊදියෙ වසන් හොරදූගොඩ ගමයේ සුමනදාස තිලකරත්න වන මම මීළඟට පැවැත්වෙන සිංහල නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීම සඳහා අයදුම්පතක් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා වෙත ඉදිරිපත් කරන බව සියලුදෙනාගේම දැනගැනීම පිණිස මෙයින් දන්වමි.

මෙයට,

ජී. එච්. සුමනදාස තිලකරත්න,
ප්‍රතිඥත ලිපිකරු තැන.

06. 06. 1973
වලහන්දූව.

6-579 —73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

**දැන්වීමයි**

බෙලිඅත්තේ සිටිනාමළුවේ පදිංචි විරිත්තමුල්ල ගමයේ චාල්ස්, ප්‍රතිඥත ලිපිකරු තැන වන මම, අද සිට මාස එකකින් පසු පැවැත්වෙන නොතාරිස් වරුන් ඇතුලත් කරගැනීමේ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනමෙන් නොතාරිස්වරුන් පිළිබඳ පරිච්ඡේද අංක 107 දරණ ආඥාපනතේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් මෙයින් ඉල්ලා සිටිමි.

චා. විරිත්තමුල්ල.

1973. 06. 04.

5-579—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උචිතනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|
| ජූනි | 73.06.01 සිකුරාද | ... | 73.05.23 බදාද | දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද | ... | 73.05.30 බදාද | දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්දා | ... | 73.06.06 බදාද | දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද | ... | 73.06.13 බදාද | දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද | ... | 73.06.20 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.